## රජයේ නිවේදන

## 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

### 3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම භාණ්ඩයක් මතම ඊට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2018 නොවැම්බර් මස ..12...... දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවිය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018 ජූලි 12 දිනැති අංක 2079/58 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියෝගය 2018 නොවැම්බර් මස ..12....... දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2018 නොවැම්බර් මස ..12...... වැනි දින,
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | විස්තරය<br>III | නිෂ්පාදන බද්ද<br>IV |
|---|---|---|---|
| 22.02 | | සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබූවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09 හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග | |
| | | | |
| | 2202.99 | අනෙකුත්: | |
| | | පළතුරු හෝ එළවළු යුෂ පාදක කර ගත් පානයන්: | |

| | | | |
|---|---|---|---|
| | 2202.99.51 | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | ලීටරයට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි (මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්) ග්‍රෑමයකට ශත 50/-<br>යන දෙකෙන් වැඩි අගය |
| | | අනෙකුත්: | |
| | 2202.99.91 | මිලි ලීටර 100 ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6 ට වඩා වැඩි පානයන් | ලීටරයට රු. 12/- හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි (මිලි ලීටර 100 කට ග්‍රෑම් 6 ක් ඉවත් කරමින්) ග්‍රෑමයකට ශත 50/-<br>යන දෙකෙන් වැඩි අගය |